# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

## பொலிஸ் ஊடகப் பிரிவு

## POLICE MEDIA DIVISION

සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No – 10120

ෆැක්ස් / தொலைநகல / Fax – 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone – 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site – www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail – dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO – 1770/ 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No – / 2024

දිනය / திகதி / Date – 28/11/2024 පැය 1015

# මාධ්‍ය නිවේදනය

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**මිනුවන්ගොඩ පොලිස් වසමේ සිදු වූ මුදල් සොරකමට අදාළ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - ගම්පහ කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.**

2024.11.18 වන දින උදෑසන කාලයේ මිනුවන්ගොඩ පොලිස් වසමේ දී මුදල් ආරක්ෂිතව ප්‍රවාහනය කරනු ලබන පුද්ගලික ආයතනයක රියදුරු වශයෙන් කටයුතු කළ පුද්ගලයෙකු රුපියල් කෝටි 07 ½ ක පමණ මුදලක් සොරකම් කර පලා යාමේ සිද්ධිය සම්බන්ධයෙන් ගම්පහ කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය හා මිනුවන්ගොඩ පොලිසිය මගින් විමර්ශන කටයුතු ආරම්භ කර තිබිණි.

ඒ අනුව, මෙම සොරකම සිදු කරන ලද සැකකරු හා සොරකම් කළ මුදල් රැගෙන යාමට යතුරු පැදියෙන් පැමිණ ආධාර අනුබල දුන් සැකකරු 2024.11.27 වන දින දහවල් කාලයේ මිනුවන්ගොඩ පොලිස් වසමේ යටියන ප්‍රදේශයේදී ගම්පහ කොට්ඨාස අපරාධ විමර්ශන අංශයේ නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන ඇත. සැකකරුවන් සන්තකයේ තිබී **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 06 මිලිග්‍රෑම් 167 ක් සහ සොරකම් කරන ලද රුපියල් ලක්ෂ 40** කට ආසන්න මුදලක් පොලිස් භාරයට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 37 හා 40 වයස් වල පසුවන සීදූව හා උඩුගම්පොල ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

ගම්පහ කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය හා මිනුවන්ගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**